පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2008/10

මගේ අංකය:- NCP/CS/PT/B/3/1/4
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.
දිනය :2008.04.23

සියලුම අමාත්‍යංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**පිරිවැටුම් බදු ආදායම් වැඩිකරගැනීම සඳහා මිලදී ගැනීම් පිළිබඳ විස්තර ලබා ගැනීම.**

පළාත් සභාවේ ආයතන වල සිදුකරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත්වලදී සහ භාණ්ඩ මිලදී ගැනීම් වලදී අදාළ වන මිලදී ගැනීම් කුවිතාන්සි වල පිටපතක් පළාත් ආදායම් කොමසාරිස් වෙත ලබාදෙන්නේ නම් ඒ ඔස්සේ පරික්ෂා කරමින් පළාත් සභාවට ලැබිය යුතු පිරිවැටුම් බදු ආදායම වැඩිකරගැනීමේ හැකියාවක් ඇති බව පළාත් ආදායම් කොමසාරිස් විසින් දැනුම් දී ඇත.

02. පළාතේ පිරිවැටුම් බදු ආදායම් වැඩිකරගැනීම සඳහා සියලුදෙනාගේම දායකත්වය ලබාදිය යුතු බැවින් ඔබ ආයතනයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිකිරීමට අදාලව භාණ්ඩ මිලදී ගැනීම සඳහා ලබාගත් කුවිතාන්සි වල පිටපත් ලබාගෙන පළාත් ආදායම් කොමසාරිස් වෙත යැවීමටත්, ඔබ විසින්/ ඔබ ආයතනය විසින් සෘජුවම මිලදී ගන්නා භාණ්ඩ වල බිල්පත් වල පිටපත් පළාත් ආදායම් කොමසාරිස් වෙත යැවීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ඒ.තලාකොටුනගේ,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත:- 01. පළාත් ආදායම් කොමසාරිස්, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - දැ.පි